සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - I

**10 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

- අංක 01 සිට 40 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

01 ශ්‍රී ලංකාවෙන් චීනයට විසිවතාවක් රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් සිදුවූ බව සඳහන් වන්නේ,
(1) භාතිකාභය රජතුමාගේ කාලයේ දී ය.
(2) දෙවන අග්බෝ රජතුමාගේ කාලයේ දී ය.
(3) දෙවන සේන රජතුමාගේ කාලයේ දී ය.
(4) හයවන අග්බෝ රජතුමාගේ කාලයේ දී ය.

02 ඓතිහාසික මූලාශ්‍රවල ''පසවන්ති නාම සාලා'' යනුවෙන් හඳුන්වා දී තිබෙන්නේ,
(1) සාමාන්‍ය ජනයාගේ සෞඛ්‍ය පහසුකම් සඳහා ඉදිකළ ගොඩනැගිලි විශේෂයකි.
(2) ගැබිණි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා ඉදිකළ මාතෘ සායන විශේෂයකි.
(3) දරුණු උණ රෝගයකින් පෙළුණු රෝගීන්ට ප්‍රතිකාර සඳහා පිහිට වූ රෝහල්ය.
(4) පාලන කටයුතු පිළිබඳව තීරණ ගැනීම පිණිස ඇතිකළ සභා ශාලා විශේෂයකි.

03 ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය වෙනත් යුගවලින් වෙන්කොට හඳුනාගත හැකි ලක්ෂණයක් නම්,
(1) ගල් මෙවලම් භාවිතයයි.
(2) පිළිස්සූ මැටි වළං භාවිතයයි.
(3) දඩයම් කිරීමෙන් ආහාර සපයාගැනීම සිදුකිරීමයි.
(4) සංචාරක සත්ත්ව පාලනය කිරීමයි.

04 පූර්ව ඓතිහාසික යුගයේ සුසාන භූමි අතුරින් සාමාන්‍ය මැටි බඳුනක භෂ්මාවශේෂ තැන්පත් කොට පොළවේ වළලා ඇති ක්‍රමය හඳුන්වන්නේ,
(1) කුම්භීය නිධානන ක්‍රමය යනුවෙනි. (2) ශිලා මංජුසා ක්‍රමය යනුවෙනි.
(3) මැටි ඔරු ක්‍රමය යනුවෙනි. (4) ශිලා ඔරු ක්‍රමය යනුවෙනි.

05 අවුරුදු දහනවයක් ශ්‍රී ලංකාවේ සිරකරුවෙකු ලෙස සිට ආපසු සිට රටට යන අතර මගදී ශ්‍රී ලංකාවේ තොරතුරු ඇතුළත් වැදගත් ඓතිහාසික ග්‍රන්ථයක් රචනා කළ පුද්ගලයා
(1) පර්නාවෝ ඩී. ක්වේරෝස් (2) රොබට් නොක්ස්
(3) පිලිප්ස් බැල්දියෙස් (4) රිබෙයිරෝ

06 ක්‍රිස්තු වර්ෂ හත්වන සියවසට අයත් දෙව්වරුන් නිරූපිත සේ සැලකෙන ඉසුරුමුණි විහාරයේ දක්නට ලැබෙන මූර්තිය නම්
(1) මිනිසා හා අශ්ව හිස (2) දිය කෙළින හස්තියන්
(3) දුටුගැමුණු රජ පවුල (4) ඉසුරුමුණි පෙම් යුවල

07 අනුරාධපුර යුගයේ මුල් කාලයේ දී ගල්ලෙන්වල කටාරම් අසල කෙටි තොරතුරු සඳහන් කර ඇති සෙල්ලිපි හඳුන්වන්නේ,
(1) ගිරි ලිපි වශයෙනි. (2) ටැම් ලිපි වශයෙනි.
(3) පුවරු ලිපි වශයෙනි. (4) ලෙන් ලිපි වශයෙනි.

08 ශ්‍රී ලංකාව පිළිබඳව තොරතුරු සඳහන් වන විදේශීය මූලාශ්‍රයන් අතර ග්‍රීක මූලාශ්‍ර 2 ක් වන්නේ,
(1) නැචුරාලිස් හිස්ටෝරියා, රාජතරංගනී (2) සිලප්පදිකාරම්, රාමායණය
(3) ඩිමුන්ඩෝ, ඉන්ඩිකා (4) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය, එදා හෙළදිව

09 මෙරට ශාසන ඉතිහාසය පිළිබඳව තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් නම්,
(1) සද්ධර්මාලංකාරය (2) රාජාවලිය
(3) නිකාය සංග්‍රහය (4) පැරකුම්බා සිරිත

10 ප්‍රාග් ඓතිහාසික ස්ථාන අතුරින් පහත රට වියළි කලාපීය ගල්ලෙන් දෙකක් ලෙස සැලකිය හැක්කේ,

(1) පාහියන්ගල ලෙන හා නිල්ගල බෙලිගල්ගේ (2) සීගිරියේ පොතාන හා අලිගල

(3) බෙල්ලන්බැඳිපැලැස්ස හා බූන්දල (4) මිනිහාගල්කන්ද හා පතිරාජවෙල

11 ප්‍රාග් ඓතිහාසික යුගයේ ආහාර රටාව ගැන කියැවෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) වල් දෙල් හා වල් කෙසෙල් යන ශාකමය ආහාර ප්‍රයෝජනයට ගත්හ.

(2) වල් දෙල් ඇට පුළුස්සා ආහාරයට ගත් බවට අවුරුදු 15000 කට වඩා පැරණි සාක්ෂි ඇත.

(3) තෙත් කලාපීය ගල් ගුහාවලින් ලැබී ඇති තොරතුරු අනුව ආහාර පිසීමට භාවිත කළ ලිප් හමුවී ඇත.

(4) ලුණු ප්‍රයෝජනයට ගෙන රසවත් බෙල්ලන් ආහාරයක් සකසාගෙන ඇත.

12 මුල් ඓතිහාසික යුගයට අයත් කාල වකවානුව වන්නේ,

(1) ක්‍රි.පූ. 450 - ක්‍රි.ව. 300 දක්වා කාලය

(2) ක්‍රි.පූ. 2400 ට පෙර යුගය

(3) ක්‍රි.පූ. 2400 - ක්‍රි.පූ. 450 දක්වා යුගය

(4) ප්‍රාග් ඓතිහාසික යුගයේ අවසානයත්, ඓතිහාසික යුගයේ ආරම්භයත් අතර කාල පරිච්ඡේදය

13 උඩරංචාමඩමේ පැරණි නිවාසයෙන් සොයාගත් පින්තාරු කළ මැටි බඳුනෙන් බැසගත හැකි නිගමනයක් නම්,

(1) මැටි භාණ්ඩ නිපදවීම පිළිබඳව උසස් තාක්ෂණයක් එකල පැවැති බවයි.

(2) වෙනත් මාධ්‍යයන් අනුසාරයෙන් භාණ්ඩ නිපදවීමක් සිදුවී නැති බවයි.

(3) සකපෝරුව භාවිතය ගැන එකල අවබෝධයක් නොතිබූ බවයි.

(4) සත්ත්ව රූප නිර්මාණයට වැඩි දක්ෂතාවයක් පැවැති බවයි.

14 ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගතවීමේ දී ගොඩනැගුණු නිලධාරී පන්තිය හා එම පුද්ගලයන්ට අයත් කාර්යයන් A හා B තීරුවලින් ගළපා නිවැරදි පිළිතුර සොයන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | නගරගුත්තික | A | භෝජන ශාලා අධිකාරී |
| 2. | බතගු | B | භාණ්ඩාගාරික |
| 3. | බඩගරික | C | චාරිත්‍ර සිරිත් පිළිබඳ අධිකාරී |
| 4. | කොතුරු ශුනා | D | නගර පරිපාලක |

(1) B C D A (2) D C B A (3) D A B C (4) A D C B

15 මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පිරික්සන විට වළං සාදන්නන් විසූ ගම් හා ගොවියන් විසූ ගම් හඳුන්වන ලද්දේ පිළිවෙලින්,

(1) කේවට්ටගාම හා කසීකාරගාම යනුවෙනි.

(2) වඩ්ඪකීගාම හා කුම්භකාරගාම යනුවෙනි.

(3) කුම්භකාරගාම හා කසීකාරගාම යනුවෙනි.

(4) පට්ඨානගාම හා කසීකාරගාම යනුවෙනි.

16 ජේතවන විහාර භූමියේ කැණීම්වලින් හමුවී තිබෙන මල් කැටයම් සහිත රන් තැල්ලෙන් අනාවරණය වන කරුණක් නම්,

(1) ආභරණ සැකසීමේ තාක්ෂණය එකල ඉතා දියුණු තත්ත්වයක පැවැති බවයි.

(2) බොහෝ දෙනෙක් රන් ආභරණ භාවිත කළ බවයි.

(3) මල් මෝස්තර සහිත කැටයම් එකල ඉතා ජනප්‍රිය වූ බවයි.

(4) රන් ආභරණ පැළඳීම නගරවාසීන් විසින් පමණක් කළ බවයි.

17 ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන ඒම සිදුවූයේ,

(1) මාතොට වරායෙනි. (2) ගෝකණ්ණතිත්ථ වරායෙනි.

(3) ජම්බුකෝල පට්ටන වරායෙනි. (4) ලංකා පට්ටන වරායෙනි.

18 ගෝකණ්ණතිත්ථ වරායට සමීපව ඉදිකර තිබෙන පැරණි හින්දු කෝවිල වන්නේ,

(1) කෝනේශ්වරම් කෝවිලයි. (2) මුන්නේශ්වරම් කෝවිලයි.

(3) තිරුකේතීශ්වරම් කෝවිලයි. (4) වනවන්මතේවීශ්වරම් කෝවිලයි.

19 දළදා මාලිගයේ ආරක්ෂාව සඳහා වේලයික්කාර හමුදාවක් පත්කළ පොළොන්නරු රජතුමා

(1) නිශ්ශංකමල්ල රජතුමා ය. (2) මහා පරාක්‍රමබාහු රජතුමා ය.

(3) පළමුවන විජයබාහු රජතුමා ය. (4) පරාක්‍රම පාණ්ඩ්‍ය රජතුමා ය.

20 අතීතයේ බොහෝ කාලසීමාවල ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර සුහදශීලී සම්බන්ධතා පැවැති බව තහවුරු වන කරුණක් වන්නේ,

(1) ශ්‍රී ලාංකික රජවරුන් වරින් වර දකුණු ඉන්දියාවෙන් කුලී හමුදා ගෙන්වා ගැනීම.

(2) අනුරාධපුර රාජ සභාවේ ''දෙමළ අධිකාරි'' නම් විශේෂ තනතුරක් දෙමළ ජනයා වෙනුවෙන් ඇතිකිරීම.

(3) ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ගමනාගමන පහසුකම් ඇතිකිරීම.

(4) ද්‍රවිඩ ජනයාගේ ආගමික කටයුතු සඳහා අප රටේ රජවරු කෝවිල් ඉදිකිරීම.

21 හානාදේසී, වලඤ්ජියාර්, අයින්නූරුවර් යනුවෙන් සෙල්ලිපිවල සඳහන් වන්නේ,

(1) ශ්‍රී ලංකාවේ වෙළඳ කටයුතු කරගෙන ගිය දකුණු ඉන්දියානු වෙළඳ සංවිධාන තුනකි.

(2) ගිණිකොණ ආසියාතික රටවලින් මෙහි පැමිණි භික්ෂූන් වහන්සේලා තුන් නමකි.

(3) අරාබි ජාතික දේශ සංචාරකයින් තිදෙනෙකි.

(4) සොළී අධිරාජයා විසින් අනුරාධපුර රාජ සභාවට පත්කළ නිලධාරීන් තිදෙනෙකි.

22 ජම්බුකෝල පට්ටන, සූකරතිත්ථ, මහා තිත්ථ යන ස්ථාන පිළිබඳ පොදු ප්‍රකාශයක් වන්නේ,

(1) වයඹ හා උතුරු ප්‍රදේශවල ක්‍රියාත්මක වූ පැරණි වරායයන් ය.

(2) භාණ්ඩ හුවමාරු කර ගැනීම සඳහා වෙළෙන්දන් රැස්වූ වෙළඳ නගරයන් ය.

(3) අන්තර්ජාතික වෙළඳ කටයුතු පවත්වාගෙන ගිය හුවමාරු මධ්‍යස්ථානයන්ය.

(4) දකුණු ඉන්දියානු පිරිස් වරින් වර මෙරටට සංක්‍රමණය වීම පිණිස ප්‍රයෝජනයට ගත් නැංගුරම් තොටවල්ය.

23 කලාඔය, දැදුරුඔය හා කිරිඳිඔය ආශ්‍රිතව පැවැති පැරණි වරායයන් වන්නේ පිළිවෙලින්,

(1) උරුවෙල, සලාවත්තොට හා තොටඵතොට

(2) උරුවෙල, ගෝණපබ්බත හා දේවනගර

(3) කදුරුගොඩ, මගන හා කාලතිත්ථ

(4) දේවනගර, මහාගාම හා ගෝණපබ්බත

24 පැරණි සෙල්ලිපිවල සඳහන්ව තිබෙන ''කම්මාර'' යන වචනයෙන් අපට තහවුරු කර ගත හැකි කාරණය නම්

(1) රටේ විවිධ ප්‍රදේශවල කම්මල්කරුවන් සිටි බවයි.

(2) ඉතා පුරාණ කාලයක සිට මෙරට ලෝහ කර්මාන්තය ඉතා දියුණු තත්ත්වයක පැවැති බවයි.

(3) විවිධ ලෝහ වර්ග ප්‍රයෝජනයට ගනිමින් භාණ්ඩ නිෂ්පාදනය කර තිබෙන බවයි.

(4) විවිධ ක්ෂේත්‍රවලට අයත් කර්මාන්ත රැසක් ක්‍රියාත්මකව පැවැති බවයි.

25 පොළොන්නරුව පාලන මධ්‍යස්ථානයක් ලෙස තෝරාගැනීමට බලපා තිබෙන ප්‍රධාන හේතුවක් වන්නේ,

(1) ගෝකණ්ණතිත්ථ වරායේ වෙළඳ කටයුතු පාලනය කිරීමට එහි සිට පහසුවීමයි.

(2) ගිණිකොණ ආසියාතික රටවල් සමග සම්බන්ධතා පැවැත්වීමට පහසුවීමයි.

(3) බුරුම දේශයෙන් භාණ්ඩ ආනයනය කිරීමේ පහසුකම් අවශ්‍යවීමයි.

(4) රුහුණු රටේ ඇතිවූ අභ්‍යන්තර ආරවුල් මර්දනය කිරීමට පහසුවීමයි.

26 පංච කකුධ භාණ්ඩ පමණක් සඳහන් වන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) වල් විදුනාව, මිරිවැඩි සඟල, මඟුල් කඩුව, සේසත, අඩයටිය

(2) තෝමරය, හෙල්ල, නළල්පටිය, සේසත, මඟුල් කඩුව

(3) මඟුල් කඩුව, සේසත, නළල් පටිය, මිරිවැඩි සඟල, වල් විදුනාව

(4) තෝමරය, අඩයටිය, මඟුල් කඩුව, ඔටුන්න, ග්‍රීවාභරණ

27 මුල් අනුරාධපුර යුගයේ දී ගම් කිහිපයකින් සකස් වූ වඩා පුළුල් ප්‍රදේශයක් පාලනය කළ පුද්ගලයින් හඳුන්වන ලද්දේ,

(1) මපුරුමුකා වශයෙනි. (2) පරුමක වශයෙනි.

(3) ගමික වශයෙනි. (4) ගෘහපති වශයෙනි.

28 විශාල ප්‍රමාණයේ වැව් දහසයක් කරවීමට තරම් වසභ රජතුමා පියවර ගත්තේ,

(1) ඉන්දියාවේ ක්‍රිෂ්ණා ගංගා නිම්නයේ ආහාර හිඟයක් ඇතිවීම නිසා මෙරට සහල් සඳහා ඉල්ලුම වැඩිවීමයි.

(2) ජනයාට ජලය සැපයීම මගින් රජයේ බදු ආදායම වැඩිකර ගැනීමටයි.

(3) රටවැසියන්ගේ ආර්ථික ශුභ සිද්ධිය සඳහායි.

(4) රජරට ප්‍රදේශයේ භූමිය වැව් තැනීමට සුදුසු ලෙස පිහිටා තිබීම නිසයි.

29 වැව් - අමුණු තනවා ආර්ථිකයට විශාල සේවයක් කිරීම නිසා මින්නේරි දෙවියන් ලෙස ජනතාව අතර පූජනීයත්වයට පත්වූයේ,

(1) ධාතුසේන රජතුමා (2) වසභ රජතුමා

(3) පණ්ඩුකාභය රජතුමා (4) මහසෙන් රජතුමා

30 පණ්ඩුකාභය රජතුමාගේ දසවෙනි රාජ්‍ය වර්ෂයේ දී සිදුවූ වැදගත් සිදුවීමක් නම්,
(1) ප්‍රාදේශීය පාලකයින් පරාජය කිරීම.
(2) අනුරාධපුරය අගනුවර බවට පත්කර ගැනීම.
(3) ග්‍රාම සීමා නියම කිරීම.
(4) මාමාවරුන් පරාජය කිරීම.

31 පහත සඳහන් ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන අතුරින් වඩාත්ම පැරණි වාසස්ථානය වන්නේ,
(1) කිතුල්ගල බෙලිලෙන (2) අත්තනගොඩ අළුලෙන
(3) සීගිරිය - පොතාන (4) බුලත්සිංහල පාහියන්ගලලෙන

32 මහා වංශය රචනා කළ මහානාම හිමියන් එකල වැඩ වාසය කළ බවට තොරතුරු ලැබී ඇත්තේ,
(1) කාලප්‍රාසාද පිරිවෙනේ ය. (2) මරුගන පිරිවෙනේ ය.
(3) එලග්ග පිරිවෙනේ ය. (4) දික්සඳ සෙනෙවියා පිරිවෙනේ ය.

33 පාහියන් හා හියුං - සාං යන භික්ෂූන් වහන්සේලා පිළිබඳව කියැවෙන නිවැරදි ප්‍රකාශනය වන්නේ,
(1) බුද්ධ ධර්මය හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවට පැමිණි අය වීමයි.
(2) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කර තැබූ චීන ජාතික භික්ෂූන් වහන්සේලා වීමයි.
(3) වසර දහයක් තිස්සේ ශ්‍රී ලංකාවේ වන්දනා කටයුතුවල නිරත වූ අය වීමයි.
(4) අභයගිරි විහාරයේ වැඩ වාසය කරමින් පාළි අටුවා සිංහලයට පරිවර්ථනය කළ අය වීමයි.

34 වී. ඕ. සී. කාසි, පනාකඩුව තඹ සන්නස වැනි දෑ අයත්වන්නේ,
(1) පුරා විද්‍යාත්මක මූලාශ්‍ර ගණයටයි. (2) ඓතිහාසික මූලාශ්‍ර ගණයටයි.
(3) අභිලේඛණ ගණයටයි. (4) නටඹුන් ගණයටයි.

35 ඉතිහාසය හදාරන පුද්ගලයකු තුළ ඇතිවිය හැකි ගතිලක්ෂණයක් නොවන කරුණ තෝරන්න.
(1) ස්වභාවයෙන්ම පොත්-පත් කියවීමට පෙළඹේ.
(2) විචාර බුද්ධිය දියුණු වේ.
(3) ගැටළුවලට නිර්මාණාත්මක විසඳුම් සෙවීමට ක්‍රියා කරයි.
(4) වටිනා පුරාවස්තුවල මූල්‍යමය වටිනාකම තක්සේරු කරයි.

36 ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ප්‍රදේශයක් වන්නේ,
(1) රත්නපුර හා අවට ප්‍රදේශවල ඇති මැණික් පතල්
(2) හල්දුම්මුල්ල හා බෙරගල සුසාන භූමි
(3) උඩරංචාමඩම ගම්මානය
(4) කිරිදිඹය පිටාර නිම්නය

37 බ්‍රාහ්මී සෙල්ලිපිවල සඳහන් වන අන්දමට ''ගහපති'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(1) ගම් කිහිපයක පාලන කටයුතුවලට සම්බන්ධ වූ පුද්ගලයෙකි.
(2) ගමක පාලන කටයුතු කරගෙන ගිය පුද්ගලයෙකි.
(3) පවුලක් නියෝජනය කළ ප්‍රධානියෙකි.
(4) පවුල් කීපයක් නියෝජනය කළ ප්‍රධානියෙකි.

38 කණ්ඩලම කොත්ගල්කන්දේ සෙල්ලිපියක සඳහන් වන අන්දමට ''තොට බොජක'' යනුවෙන් සඳහන් කර ඇත්තේ,
(1) තොටුපළෙන් ලැබෙන ආදායම පරිහරණය කළ පරුමකයකු ගැනයි.
(2) බුරුම දේශයට තානාපතීන් යැවීමට මූලිකත්වය ගත් අයෙකු ගැනයි.
(3) තොටුපළේ ආදායම ලේඛණගතකළ පුද්ගලයෙකු ගැනයි.
(4) ජනයාගේ කැමැත්තෙන් ප්‍රදේශයේ පාලන බලය ලබාගත් පුද්ගලයෙකු ගැනයි.

39 මෙරට ජනයා ගම්මානවල ජීවත්වීම ආරම්භ වූයේ,
(1) මහා ශිලා යුගයේ දී ය. (2) පූර්ව ශිලා යුගයේ දී ය.
(3) පූර්ව ඓතිහාසික යුගයේ දී ය. (4) ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ය.

40 දේශපාලන බලය කේන්ද්‍රගත වීම යනුවෙන් හඳුන්වන්නේ,
(1) ප්‍රාදේශීය පාලන ඒකකවලට බෙදා පාලන කටයුතු කිරීමයි.
(2) රටේ පාලනය එක් පාලකයකු යටතට පත්වීමයි.
(3) නිශ්චිත නිලධාරී මණ්ඩලයක් පාලන කටයුතු සඳහා යෙදවීමයි.
(4) විරුද්ධවාදීන් සියලු දෙනාම විනාශ කොට බලය අත්-පත් කර ගැනීමයි.

(2 x 40 = 80)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - II

**10 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.**

01 (අ) සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම ප්‍රයෝජනයට ගෙන පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න. (ල. 10)

කිරිඳි ඔය / සූකරතිත්ථ / සලාවත්තොට / සීගිරිය / මාදුරුඔය / දේව නගර / රංචාමඩම / මාන්තායි / රාවණා ඇල්ල ලෙන / ගල්ඔය

(ආ) සපයා ඇති පින්තූර ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.


A


B


C

(i) (a) A අක්ෂරයෙන් පෙන්වා ඇති පින්තූරයේ දක්වෙන්නේ කුමක් ද?

(b) එය හමුවී තිබෙන්නේ කවර ස්ථානයකින් ද?

(c) එයින් තහවුරු වී තිබෙන කරුණ කුමක් ද? (ල. 03)

(ii) (a) B අක්ෂරයෙන් පෙන්වා ඇති පින්තූරයේ සිටින පුද්ගලයා කවුරුන්ද?

(b) දැනට මෙම ප්‍රතිමාව දක්නට ලැබෙන්නේ කවර ස්ථානයක ද?

(c) මෙම පුද්ගලයාගෙන් සිදුවූ එක් සේවාවක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) C අක්ෂරයෙන් පෙන්වා ඇති ගොඩනැගිල්ල කුමක් ද?

(b) එය කවර ගෘහ නිර්මාණ ශිල්පයකට අයත් වේද?

(c) එය දක්නට ලැබෙන්නේ කවර ස්ථානයක ද?

(d) මෙම ගොඩනැගිල්ල නිර්මාණය සඳහා යොදාගෙන ඇති මාධ්‍යය කුමක් ද? (ල. 04)

(ඇ) ගැළපෙන වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(a) පොළොන්නරුවේ රජකම් කළ පළමුවෙනි විජයබාහු රජතුමා

තිලෝකසුන්දරී නම් ...................................... වංශික කුමාරිකාවක් විවාහ කර ගති.

(b) වසභ රජතුමා විසින් විශාල ප්‍රමාණයේ වැව් ............................ ක් ඉදිකරන ලද බව වංශකථාවල සඳහන් වේ.

(c) පණ්ඩුකාභය රජතුමා සිය පාලන මධ්‍යස්ථානය ලෙස ....................................... තෝරා ගත්තේ ය.

(d) දඹුල්ලේ කළුදිය පොකුණ විහාරයේ සෙල්ලිපියට අනුව විහාරයට දානය සැපයීම පිළිබඳව කිසියම් ගැටළුවක් මතුවුවහොත් ............................................. රැස්වී එම ගැටළුව විසඳිය යුතුවේ.

(e) කොළඹගෙආර .................................................... නම් ප්‍රදේශයෙන් පූර්ව ඓතිහාසික යුගයේ සොහොන් බිමක් මතුකරගෙන තිබේ. (ල. 05)

(ඈ) කෙටි පිළිතුරු සපයන්න.

(a) මෙරටින් හමුවී තිබෙන පැරණිතම කාසි වර්ගය කුමක් ද?

(b) ශ්‍රී ලංකාවේ ලියැවී ඇති දීර්ඝතම සෙල්ලිපිය නම් කරන්න.

(c) ශ්‍රී ලංකාවේ සිතියමක් නිර්මාණය කළ මුල්ම භූගෝල විද්‍යාඥයා කවුද?

(d) දන්ත ධාතූන් වහන්සේ මෙරටට වඩමවන ලද්දේ කවර ස්ථානයෙන් ද?

(e) මාතොට වරායට සමීපව ඉදිකොට තිබූ පැරණි හින්දු කෝවිල කුමක් ද?

(ල. 05)

02 (i) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ පාලන කටයුතු පිණිස ක්‍රියාත්මක වූ ''එක්තැන්සමිය'' යනු කුමක්දැයි කෙටියෙන් අර්ථ දක්වන්න.

(ii) එකල රාජ්‍ය උරුමය සම්බන්ධයෙන් අනුගමනය කළ ක්‍රම 2 ක් ලියන්න.

(iii) අනුරාධපුර යුගයේ රජවරු ජනතාවගේ සුභසිද්ධිය සඳහා ද ක්‍රියා කළ බව උදාහරණ දෙකක්වත් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(iv) එකල රජවරු විදේශයන් සමග ද ඉතා සුහදශීලී සම්බන්ධතා පවත්වා ඇත. අවස්ථා 3 ක් වත් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරමින් ඉහත කරුණ ඔප්පු කරන්න.

03 (i) අනුරාධපුර - පොළොන්නරු යුගවලින් හමුවී තිබෙන පැරණි වාස්තු විද්‍යාත්මක නිර්මාණ 3 ක් නම් කරන්න.

(ii) සොර බොර වැව ටැම් ලිපියේ සඳහන් වන පරිදි හෝපිටිගමු වෙළඳපලේ කටයුතු කරගෙන ගිය ආකාරය දක්වෙන කරුණු 2 ක් ලියන්න.

(iii) සීගිරියේ ජල මල් සකස් කිරීමේ දී බලාපොරොත්තු වී තිබෙන අරමුණ හා එය ඉටුකර ගැනීමට අනුගමනය කර තිබෙන සරල තාක්ෂණික ක්‍රම පැහැදිලි කරන්න.

(iv) එකල මෙරට දියුණු වෛද්‍ය තාක්ෂණයක් මෙන්ම උසස් සනීපාරක්ෂක ක්‍රමද පැවැති බව උදාහරණ දක්වමින් විස්තර කරන්න.

04 (i) අතීත රජරට ජනයා වැව් තැනීමෙන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු 3 ක් ලියන්න.

(ii) එලෙස ඉදිකර ඇති විශාල ප්‍රමාණයේ වැව් 4 ක් නම් කරන්න.

(iii) පෞද්ගලික ජල පරිහරණයේ දී ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා කරගැනීම සඳහා අතීතයේ යොදාගත් තාක්ෂණික ක්‍රම පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

(iv) වැවකට සම්බන්ධ ප්‍රධාන අංග 3 ක් නම් කර ඒවායින් වැවේ ස්ථාවර භාවයට ඉටුවූ සේවාවන් අගයන්න.

05 (i) (a) මහලේ (b) සභාව (c) දසගම් ඇත්තන්

යන වචනවලට සමාන අදහසක් දෙන ප්‍රකාශන වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

(අධිකරණය නියෝජනය කරන නිලධාරීන් / ගම් දහයක ප්‍රධානීන්ගෙන් සමන්විත මණ්ඩලය / රජතුමා / රජයේ කටයුතු ලේඛණගත කිරීම)

(ii) පැරණි ශ්‍රී ලංකාවේ දක්නට ලැබුණු කර්මාන්ත 4 ක් සඳහන් කරන්න.

(iii) අනුරාධපුරය නගරයක් වශයෙන් වර්ධනය වීමට තුඩුදුන් කරුණු විස්තර කරන්න.

(iv) පැරණි ශ්‍රී ලාංකික සමාජයේ ආර්ථික කටයුතු සකස් වී තිබූ ආකාරය අංශ 2 ක් වත් ආශ්‍රයෙන් විස්තර කරන්න.

06 (i) පැරණි ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශය වීමේ දී මහරජතුමා ජනතාව ඉදිරියේ බලවත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටීම සඳහා යොදාගෙන තිබෙන සංකල්ප 3 ක් ලියන්න.

(ii) රටේ ක්‍රමානුකූල පාලනයක් ගෙනයාම පිණිස වසභ රජතුමා අනුගමනය කර තිබෙන පියවර 2 ක් දක්වන්න.

(iii) කාශ්‍යප රජතුමා තම පියා වූ ධාතුසේන රජතුමාගේ රාජ්‍යය පැහැරගැනීමේ සිද්ධිය, පැරණි රාජ්‍ය උරුම සම්ප්‍රදායයන් අනුව කොතෙක් දුරට සාධාරණ හෝ අසාධාරණ වන්නේදැයි පැහැදිලි කිරීමක් කරන්න.

(iv) පොදු අරමුණක් මුල්කරගනිමින් රට වෙනුවෙන් දේශපාලන ක්‍රියාවලියකට එළඹුණු ප්‍රථම රජතුමා වශයෙන් දුටුගැමුණු රජතුමාගේ කාර්යභාරය අගයන්න.

07 (i) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට තුඩුදුන් කරුණු පරීක්ෂා කිරීමේ දී කුඩා වැව් කේන්ද්‍ර කර ගනිමින් වර්ධනය වී තිබෙන වැව් ගම් 3 ක් නම් කරන්න.

(ii) ගල් යුගයේ ජනයා ආහාර වශයෙන් යොදාගත් බවට තොරතුරු අනාවරණය වී ඇති ආහාර වර්ග 4 ක් සඳහන් කරන්න.

(iii) කැණීම්වලින් අනාවරණය කරගෙන තිබෙන තොරතුරු අනුව පූර්ව ඓතිහාසික යුගයේ නිවාසවල සැකැස්ම විස්තර කරන්න.

(iv) පූර්ව ඓතිහාසික යුගයට අයත් සේ සැලකෙන මහා ශිලා සුසානවලින් හමුවී තිබෙන තොරතුරු අනුව භස්මාවශේෂ තැන්පත් කිරීමට අනුගමනය කර තිබෙන ක්‍රම පිළිබඳව විමසීමක් කරන්න.

08 (i) දහවන ශ්‍රේණියේ ශිෂ්‍යයකු වන ඔබට ඉතිහාසය විෂයය ඉගෙනීමෙන් ලද හැකි

(01) (අ) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම.

